# ශ්‍රී ලාංකේය ගැමි සමාජයේ විශ්වාස පද්ධතියක් වන නිමිතිවල සමාජීය කාර්යභාර්යය පිළිබඳ විමසුමක්

ජේ.ඒ.එන්.ඒ. ජයකොඩි*

## සංක්ෂේපය

ශ්‍රී ලංකාවේ ගැමි සමාජයන්හි අතීතයේ පටන් පැවති විශ්වාස පද්ධතියක් ලෙස සැලකෙන නිමිති පිළිබඳව හැඳුන්වමින්, අද්‍යතනයේදීත් භාවිත වන නිමිති ගෙන හැර දක්වමින්, එම නිමිතිවලින් ගැමි සමාජයට සිදුවූ කාර්යභාර්යය පිළිබඳව ප්‍රධාන වශයෙන් ලිපියේ සඳහන් වේ.

## හැඳින්වීම

ලෝකයේ විශිෂ්ට සංස්කෘතික ලක්ෂණ පෙන්නුම් කරන්නා වූ ගැමි සමාජයන්හි පවත්නා විවිධ විශ්වාස පද්ධතීන් අතුරින් ශ්‍රී ලාංකේය ගැමි සමාජයන්හි පවත්නා නිමිති ප්‍රධාන තැනක් ගනු ලබයි. දෛනික ජීවිතයේ අත්දැකීම් සමඟ ගැමියන් විසින්ම නිර්මාණය කරගත් මෙම නිමිති, ගැමියාගේ සමාජ ජීවිතය යහපත්ව පවත්වාගැනීමට උපයෝගී වූ ආකාරයත්, නිමිති පද්ධතිය සමාජ පාලන කාරකයක්, ආරක්ෂණ ක්‍රියාමාර්ගයක් වූ ආකාරයත් පිළිබඳ කෘත්‍යාත්මක පර්යාලෝකය ඔස්සේ විස්තරාත්මකව මෙම ලිපියේ විග්‍රහ වෙයි.

## නිමිති යනු

නිමිති පිළිබඳ ආරම්භය විමසා බැලීමේදී "අවුරුදු 25000කටත් වඩා අඛණ්ඩ පැවැත්මක් ඇති බැව් හෙළිවේ. නිමිති යන්න භාවිතා වී ඇත්තේ ගුප්ත විද්‍යාත්මක අර්ථයෙනි. නමුත් එය අප දැනුවත් ලිඛිත ඉතිහාසය පමණි" (චන්දන, 1992). මෙම ලිඛිත ඉතිහාසය තුළ නිමිති බදු දහමේ අභාෂයත් සමඟ බද්ධ වී ඇති බවත්, නිමිතිවල විවිධ වර්ගයන් දැකිය හැකි බවත් හඳුනා ගතහැකිය.

විශේෂයෙන්ම දකුණු ආසියාතික සමාජයන්හි මෙම විශ්වාස වැඩි වශයෙන් තිබෙන්නට ඇතැයි විශ්වාස කළ හැක. ඉන්දියාව තුළ මෙවැනි විශ්වාස පැවැති බවට බුද්ධ චරිතය සාක්ෂි දරයි. "සිදුහත් කුමරුගේ නම් තැබීමේ උත්සවයට පැමිණි නිමිත්ත පාඨකයෝ නළලේ ඌර්ණ රෝම ධාතුව දකුණට කැරකී තිබෙනු දැක හෙතෙම බදුවන බව ප්‍රකාශ කළහ. සිද්ධාර්ථ බෝධි සත්ත්වයන් දුටු සතර පෙරනිමිති ද ඊට නිදසුන්ය"(මෛත්‍රීය ස්ථවිර, 1962). බුද්ධ චරිතයේ බොහෝ අවස්ථාවල දී නිමිති යන්න භාවිත වූ බැව් එය විමසා බැලීමේ දී හඳුනාගත හැක. මෙම කරුණු අනුව ද නිමිති යන්න අනාගතයේ සිදුවන යම් දෙයක් කල් තියා (පෙර) දැනගැනීම පිණිස භාවිත වුවක් ලෙස අර්ථ දැක්වීම නිවැරදි වේ.

"පෙරනිමිති යනු යමෙක් ආරම්භ කිරීමට හෝ ගමනක් යෑමට පෙර පෙනෙන හෝ හමුවන සුභ හෝ අසුබ ලකුණු නැතිනම් පූර්ව නිමිතිය" (ලියනගේ, 2000). සලකුණ, සංඥාව

* *තාවකාලික කථිකාචාර්ය, සමාජ විද්‍යා අධ්‍යයන අංශය, jan.amalijayakody@gmail.com*

යනදී අන්වර්ථ නාමයන් ද මෙම පෙර නිමිති හෝ නිමිති යන්න තුළ ගැබ් වෙයි. "නිමිති යනුවෙන් හඳුන්වන්නේ යමක් සිදුවීමට පෙර එය සිදුවන බව දක්වන පූර්ව ඉඟිය යනුවෙනි. 'ආඳා බාදා' ලෙස ද ගැමියෝ මෙය සලකති. අනාගතයේ සිදුවන දේ යම් ලක්ෂණයක් දැක භාවිකථනය කිරීම, ශරීර ලක්ෂණයක් හෝ වෙනත් යමක් බලා එසේ ප්‍රකාශ කිරීම ද නිමිති මාර්ගයන්ට ඇතුලත් වේ" (ලියනගේ, 2000).

ජ්‍යොතිෂ්‍ය ශාස්ත්‍රය සමඟ නිමිති යන්න දැඩිව බැඳී පවතින්නකි. "තත්කාල නිමිති හා ඉන්ද්‍රගුරුළුව යනාදියෙන් අනාගතයේ සිදුවන දෑ දැනගන්නා අතරම නිමිති බැලීම, නිමිති ඇල්ලීම ද නක්ෂත්‍රයටම අදාල වූ ඒවා වෙයි" (පිරිස්, 2007). "තත්කාල නිමිති යනු කෙනෙකු සතු බඩු බාහිරාදියක් නැති වූ විටක ඒ පිළිබඳව සහ සොරාගත් තැනැත්තා පිළිබඳව දැනගැනීමේ නිමිති ක්‍රමයකි. ඉන්ද්‍රගුරුළුව යන්න තුළින් ද අනාගතයේ සිදුවන දෑ පෙන්නුම් කිරීම මෙන්ම ශාන්ති කාව්‍ය, මන්ත්‍ර ගුරුකම් යනාදිය සඳහා ද භාවිත වන්නකි. තවද ග්‍රහ පිහිටීම් අනුව අනාගත ඵල කථනයන් කිරීම නක්ෂත්‍රයට අදාල වුවකි" (චන්දන, 1992). නිමිති වර්ග බොහෝමයක් අතීතයේ පැවැති බැව් එයින් හෙළි වෙයි.

මෙම සියලුම නිමිති වර්ගයන් ගුප්ත ශාස්ත්‍රයන්ට ඇතුළත් වන්නකි. නමුත් සාම්ප්‍රදායික ජන සමාජයන්හි පරිසරය හා බද්ධ වූ නිමිති ක්‍රමයන් ද හඳුනා ගත හැකි වෙයි. සාම්ප්‍රදායික සමාජවල එම නිමිති ක්‍රම ආරම්භ වීමට මිනිසුන්ගේ අත්දැකීම් ප්‍රබල වශයෙන් බලපාන්නට ඇත. ඇතැම්හු එම නිමිති මිත්‍යා විශ්වාස පදනම් කොටගත් අභිචාර විශේෂයක් ලෙසද හඳුන්වනු ලබති. මෙම නිමිතිවලින් සිදුවන ඵල කථනයන්ට අනුව ඒවා,

1. සුබ නිමිති
2. අසුබ නිමිති
3. බාධක නිමිති (චන්දන, 1992)

යනුවෙන් වර්ග වෙයි. සාම්ප්‍රදායික ජන සමාජයන්හි භාවිත වූ මෙම නිමිති ගමනක් යාමේදී, සුබ කටයුත්තක් අරඹීමේදී ප්‍රධාන වශයෙන් බලපානු ලබයි. එම නිමිති සජීවී මෙන්ම අජීවී වස්තූන් හා සමඟ ද බද්ධ වී පවතී. යම් අවස්ථාවක කටයුත්තකට යාමේදී එය සාර්ථකවන බවට නිමිත්තක් ලැබුණහොත් එය සුබ නිමිත්තක් වන අතරම එයට බාධාවක් සිදුවන නිමිත්තක් පහළ වුව හොත් ඒවා අසුබ නිමිති වෙයි. බාධක හෙවත් උදාසීන නිමිති යනු සුබ හා අසුබ නිමිති යන දෙවර්ගයටම ඇතුළත් නොවන නිමිතියි. ඉහත නිමිති සඳහා කාරකවන විවිධ දෑ පවතී. ඒවා කොටස් 03 කි. මේ ආකාරයෙන් ග්‍රාමීය සමාජ සංස්කෘතිය තුළ පවතින නිමිති කිහිපයක් වර්ග සහිතව දැක්වීමෙන් ඒවායෙන් සිදු වූ සමාජීය කාර්යභාරය හඳුනා ගැනීමට පහසු වෙයි.

**ශ්‍රී ලාංකේය ගැමි සමාජයන්හි පවත්නා නිමිති වර්ග**

1. සත්ත්ව ලෝකය හා සම්බන්ධ නිමිති

විවිධ වූ සතුන් එනම්, උරග, සිව්පා, පක්ෂි, කෘමි ආදී සතුන්ගේ සන්නිවේදනයන්, චර්යාවන් ආශ්‍රයෙන් නිමිති ඵලවන බවට සාම්ප්‍රදායික ජනයා විශ්වාස කිරීම තුළ

ගොඩනැඟුණු නිමිති ආකාස්මික නිමිති හෙවත් සත්ත්ව ලෝකය හා සම්බන්ධ වන නිමිති ලෙස හඳුනාගත හැක.

ගැමි සමාජයන්හි ප්‍රජාවගේ සමීපතමයන් වන බල්ලා, බළලා, නරියා, ගවයා යනාදී සව්පා සතුන් නිමිති ඵල කරන සත්ත්වයන් ලෙස හඳුනාගෙන තිබේ. එම නිමිති කිහිපයක් පහත අයුරිනි.

- සිව්පා වර්ගය

i. බල්ලා

- බල්ලන්ගේ උඩුබුරලෑම මරණයක්, ගම තුළ ආරවුලක් ඇති කරන බවට නිමිත්තකි.
- බල්ලා තම පිටුපස ප්‍රදේශය බිම උලාගෙන ගේ දෙසට ඇදී යාම, ඥාතියෙකු, ආගන්තුකයෙකු හෝ හදිසි ධනලාභයක සංඥාවකි.
- විකිණීමට තිබෙන භාණ්ඩයකට බල්ලෙකු මුත්‍රා කළහොත්, එම භාණ්ඩය ඉහළ මිලකට විකුණා ගත හැකි වේ.
- ගමනක් පිටත් වීමට පෙර බල්ලා ඇඟ වටේ කැරකෙන්නේ නම්, කෙඳිරි ගාන්නේ නම් ගමන අසුබයි.
- දඩාවතේ යන බල්ලෙක් ඉදිරියට පැන අවහිර කරන්නේ නම් අසුබ නිමිත්තකි, කරදර බාධා ඇති වේ.
- ඇඳ සිටි වස්ත්‍රයෙන් ඇදීම හදිසි අනතුරු වලට හේතු වේ.
- බල්ලෙක් කෙණ්ඩ සිම්බොත් සුභ ගමනකි.
- වම් කලවා සිම්බොත් සුබ සහ පස්කම් සැප ලැබෙන ගමනකි.
- දකුණු කලවා නම් සියලු සම්පත් ලැබී ඉෂ්ට ප්‍රතිඵලයක් ලැබේ.
- බල්ලා අත ලෙවකන්නේ නම් ගමන දුක් කරදර ඇතිවන්නකි.
- ගමන යන්නට පෙර බල්ලා එහෙ මෙහෙ දුවමින් දෙපා ඉදිරියට දිගු කර ආචාර කරයි නම් ගමන සුබය.
- ගමනක් යන්නට පෙර බල්ලන් පොර කන්නේ නම් ගමන අසුබය.
- යමක් ඩැහැගෙන බල්ලා ඉදිරියට යයි නම් සුබ නිමිත්තක් වන අතර ගමනින් ගරු සැලකිලි, ආදර සංග්‍රහ ලැබේ.
- යමක් ඩැහැගෙන බල්ලා තමා ඉදිරියට ආවේ නම් ලෙඩ වී හෝ කරදර මධ්‍යයේ ගමනක නිමාව දකී.

(විජේසූරිය, 1997/ ආනන්ද, 2000/ දිසානායක, 1997)

ii. බළලා

- බළල් සංවාසයක් හෝ බළල් පොරයක් දක්නට ලැබීම ශෝකජනක මරණයක් පිළිබඳ අසන්නට හේතු වන්නකි.
- බළලා ගෙයි මිදුලේ සිට ගේ දෙස බලාගෙන උගේ අතින් මූණ පිසදමයි නම් එදිනට නියත වශයෙන්ම ඥාතියෙකුගේ පැමිණීම සිදු වෙයි.
- බළලා ගෙයි මුදුන් වහලයට නැග පොරකන්නේ නම් එය ද මර විපතක් පැමිණෙන බවට හැඟවෙන පෙරනිමිත්තකි.
- බළලා කලබලයෙන් ඔබ-මොබ දුවමින් කොට්ට මෙට්ට හා දොර ජනෙල් රෙදි පහුරු ගෑම වැසි කුණාටුවක අනාවැකියකි.

- බළලා ගින්දරට පිටුපා සිටින්නේ ශීත කාලය ළං වන විට යැයි ද විශ්වාසයක් පවතියි.
- හදිසියේ ආගන්තුක කළු බළලෙකු නිවසට පැමිණීම වාසනාවේ සළකුණකි.
- කළු බළලෙකු වාහනයට හැප්පීම නරක නිමිත්තකි.

(ගමගේ, 1998/ චන්ද්‍රන හිමි, 1992/ පීරිස්, 2007)

iii. නරියා

- ගමනක් යන විට පළමුවෙන්ම පෙරමගට නරියෙකු හමු වීම අසුබ නිමිත්තකි.
- ගමවටා හූ කියමින් නරින් හැසිරීම කලාතුරකින් දක්නට ලැබෙන සිදු වීමකි. මෙය මරණයක් පිළිබඳ අනාවැකි එලකරන්නක් ලෙස ගැමියන් විශ්වාස කරති. මෙයින් රාත්‍රී කාලයේ දී මෙන් ම අළුයම කුඹුරේ හෝ ඕවිටේ නරි රැළ හූ කියයි නම් සතියක් යාමට පෙර ගමට දුර්විපතක් සිදු වන බව පැවසේ. ඇතැම්හු මෙය දින නවයකින් සිදු වන බව ද විශ්වාස කරයි.
- කාලගුණය එනම් වැසි ලැබීම පිළිබඳව ද නරි හූව නිමිත්තක් ලෙස ගැමියෝ විශ්වාස කළහ.

(ආනන්ද, 2000/ විජේසූරිය, 1997)

iv. උරග වර්ග -බෝදිලිමා, හූනා, තලගොයා සහ කබරගොයා

- බෝදිලිමා හැඬීමේ පෙර නිමිත්ත නම් බෝදිලිමා පිට පිට දින හතක් හැඬීම වසංගත රෝග ඇති වීම යන්නයි.
- හූනා හැඬීම සුබ මෙන්ම අසුබ නිමිති එල වන අතරම හූනා හඬන දිශාව සහ දවස අනුව ද ඊට නියමිත සුබ හෝ අසුබ ලක්‍ෂණ පවති. එමෙන්ම හූනා ඇඟට වැටීම අනුව ද පෙර නිමිති දැක්වෙන බව පැරැන්නෝ විශ්වාස කළහ.
- තලගොයෙකු ගෙට පැමිණීම ගෙහිමියන්ගේ අනාගත බලාපොරොත්තු සඵල වන බවට සුබ නිමිත්තක් ලෙස සලකා තිබේ. ඇතැම් ප්‍රදේශ වල එය අසුභ නිමිත්තත්ක ලෙස සලකයි.
- කබරගොයෙකු ගෙට පැමිණීම නම් නියත වශයෙන්ම අසුභ නිමිත්තකි. මුළු නිවසටම අභාග්‍ය සම්පන්න කාලයක් උදා වන බවට සංකේතයක් ලෙස එය සලකති.
- ගමනක් යන අතර මග නාගයෙකු හමු වුවහොත් ගමන ඉතාම ශුභඵල ගෙන දේ. එසේම ගෙදරක වහලයෙන් ගෙයි මැදට නයා වැටීම හෝ තෙවරක් පෙනය ගැසීම නියත වශයෙන්ම ගෙහිමියාට මරණය ආසන්න වූ බවට එල කරන නිමිත්තක් බැව් විශ්වාස කරන අතරම නාග සංසර්ගය දැකීම ද අසුබ වෙයි.
- ගැරඬියා අපේක්‍ෂා භංගත්වයේ සංකේතයක් බව ගැමියා විශ්වාස කරයි. ඉදිරි මගට ගැරඬියෙකු හමු වීම බලාපොරොත්තු කඩ වීමේ පෙරමග නිමිත්තකි. කහ ගැරඬියෙකු හමු වූයේ නම් වඩාත් විපත්ති දායක වේ.

- පක්ෂි වර්ග

i. කපුටා

- හිරු උදාවට පළමුව නිවස අසළ සිට කපුටෙක් හඬයි නම් එය ගෙදර අයට ශෝක මරණ හා ලෙඩ දුක් පැමිණීමේ නිමිත්තයි.
- ඉර මුදුන් වේලාවේ හැඬීම සතුට ද හවස හැඬීම ඥාති මිත්‍රයින්ගේ පැමිණීම සිදු වේ.

- කපුටාගේ හැඬීම මොලොක් හඬින් නම් යහපත් ය, හඬ රළු නම් හැම විටම අසුබය.
- කෑම කන වෙලාවේ දී ගිනිකොණ බලා හඬයි නම් සිය බිරිඳට අපල පැමිණීම. (සමහරෙකු මෙය මිත්‍රාගමනය හා ජය මොහොත දක්වන්නක් සේ සලකති.)
- කපුටා කිරි ගසක සිට හැඬීම සුබ ය.
- ඉර මුදුන් වේලාවේ ගෙදර වහලයේ සිට හැඬීම හොරකමක් වීමට නිමිති එල කරයි.

(විජේසූරිය, 1997/ ආනන්ද, 2000/ දිසානායක, 1997)

ii. උලමා

උලමා හැඬීමේ නිමිති ලෙස, වසංගත රෝග ඇති වන බවත්, ගම් දනව් වැනසෙන බවත් සැලකෙන නිසා ප්‍රතිකාර ලෙස සූනියම් දෙවියන්ට පොල් ගැසීම, අහු කැපීම කරනු ලබයි. නමුත් දිශාව අනුව, බටහිරින් හැඬීම වැස්ස ද; උතුරින් හැඬීම ඥාති සම්ප්‍රාප්තිය ද; නැගෙනහිරින් හැඬීම මරණය ද; වන බවට පූර්ව නිමිති එල කෙරේ. මීට අමතරව කන කොකා, දෙමලිච්චා, පොල්කිච්චා, කැරලා යන පක්ෂීන් අසුබ කාරක සන්නිවේදනයන් ගෙන එන්නන් බව හඳුනා ගැනේ.උකුස්සා, වැහිළිහිණියා කාලගුණය පිළිබඳ අනාවැකි එල කරයි.

- **කෘමි ගණය** - කළු කුරුමිණියා, දෙබරුන්, බඹරුන් හා මී මැස්සන්, කඩියන්, මෙරුවන්

- කළු කුරුමිණියා රාත්‍රි කාලයේ ගෙට පැමිණ ඒ-මේ අත හැසිරේ නම් හොරෙකුගේ පැමිණීමත්, නිවස තුළට පැමිණීම වුවද නිවස පාළු වීමේ ලකුණක් ලෙසත් සැලකේ.
- ගෙයි වහලයේ මුදුන් යට ලීයේ දෙබරයක් හෝ බඹරයක් බැඳීම නිවැසියන්ට අපල උපද්‍රව වැළඳී තිබෙන බවට පූර්ව සංඥාවක් බවට සැලකී තිබේ.
- මී මැස්සන් ගෙයි මුදුන් යටලීයේ හෝ මුදුන් බිත්තියේ මීයක් බඳින්නේ නම් එය ඉතාමත් සුබ එල ගෙන දෙන සිදු වීමකි. එය වාසනාවන්ත කාලයක පෙරනිමිත්තක් වන අතර ධන ලාභ ලැබීමට හේතුවක් වන බවටත් විශ්වාස කෙරේ.
- කඩියන්, මෙරුවන් වැනි සතුන් වර්ෂාව ලැබීම ආසන්නයේ මතු වන බැව් විශ්වාස කෙරේ.

2. නිමිති කාරක පුද්ගලයන්

යම් කටයුත්තකට පිටත් වීමේදී, පෙරමගට හමුවන පුද්ගලයා අනුව ගමනේ සුබ අසුබ බව තීරණය කිරීමක් සාම්ප්‍රදායික සමාජ තුළ පමණක් නොව නූතන සමාජයෙහි ද පවතී, ඒවා නිමිති කාරක පුද්ගලයින් හා සම්බන්ධවන නිමිති වෙයි.

- සුභ ගමනක් යන විට භික්ෂුවක්, යාචකයෙක්, වඳ ස්ත්‍රියක්, මුහුණේ රැවුල ඇති ස්ත්‍රියක්, අංගවිකල අය, අවි ආයුධ ඇති අය, රෝගීන් මුණ ගැසීම අසුබය.
- ගැබිණි මව, කිරි රැගෙන එන්නන්, කුඩා ළමුන්, පාසල් යන/ පන්සල් යන අය (වැන්දඹු නොවන), බඩු මල්ලක් රැගෙන එන, පිළිවෙළකට ඇඳගෙන එන අය මුණ ගැසීමෙන් ගමන සුභ වේ.

(විජේසූරිය, 1997)

3. ස්වභාවික පරිසරය සමඟ සම්බන්ධවන නිමිති

ස්වභාවික පරිසරයේ වෘක්ෂලතා, අප ප්‍රයෝජනයට ගන්නා ද්‍රව්‍ය හා සම්බන්ධයෙන් ද නිමිති බිහි වී තිබෙයි. මෙම විවිධාකාරයේ වූ නිමිති ලෝකයේ විවිධ රටවල ඔවුන්ට ආවේණික ආකාරයෙන් භාවිත වන බවක් හඳුනා ගත හැකි වෙයි.

- කත් කෙසෙල් සෑදීම වතුපිටි පාළුවට හේතුවකි. (කත් කෙසෙලේ යනු එකම කෙසෙල් කැනක් කොටස් කිහිපයකින් යුක්ත වන සේ සෑදීමයි.)
- මිදුල ඉදිරිපස තැඹිලි පැල සිටු වීම, තැඹිලි පැල පීදීම පවුලේ පිරිමි දරුවන් කෙරෙහි අසුබ ලෙස බලපායි.
- සුදෝ සුදු වතුසුද්ද මල් ගෙයි දොරකඩ සිටු වීම අනුචිත බව කියයි.
- තල මල පිපීම ගම් පාළු වීමට හේතු වේ.
- ගෙයි ඇතුළත බිම් මල් පිපීම අසුභ කාලයක උදාවයි.
- රාත්‍රියේ දේදුන්න පෑයීම මහත් දුර්දශාවක පෙරනිමිත්තකි.
- ඇඳි වතට ගිනි ඇවිලීම අසුබ ලකුණකි. එවැනි සිද්ධීන් මාරාන්තික රෝගාබාධයන්ගේ සහ වස්තු විනාශයේ පෙර නිමිති ලෙස ගැමියන් විශ්වාස කරති.
- ලිප පිපිරීම, දරමිටි බඳිද්දී අයිතිකරු දෙසට රූටා ලිස්සා ඒම, කුල්ල හෝ නෑඹිලිය රූටා යාම ඥාතීන් පැමිණීම හඟවන ලකුණකි.

(පීරිස්, 2007)

මීට අමතරව "ශරීරයේ විවිධ අංගයන්ගේ සෙලවීම් පදනම් කරගත් අංග විස්ථූර්ණ නමිති සහ සිහින ඵලාපල හා සම්බන්ධ වූ නිමිති ද පවති.'' (විජේසූරිය, 1997). විශේෂයෙන් සත්ත්ව ලෝකය තුළ සන්නිවේදනයෙන් ආශ්‍රයෙන් ගොඩ නැගී ඇති නිමිති හා අවශේෂ නිමිති ප්‍රබල ලෙසම දැකිය හැක්කේ ග්‍රාමීය සමාජයන්හිය. නමුත් "ගැමි නූගත් ජන කොට්ඨාශ අතර මෙවැනි විශ්වාසයන් බහුල අතර උගත් යැයි සම්මත ජනතාව අතර ද මේවා නැත්තේ නොවේ" (මාදුවගේ, නවයුගය, 2001). එම නිසා නූතන ජනයා අතර ද මෙම විශ්වාසය පවතින බවත් හඳුනාගත හැකි වන්නේ ගතානුගතිකව පාරම්පරිකව මෙම විශ්වාස පැවත ඒම නිසාවෙනි.

මෙම නිමිති පුරාණ ගැමියා විසින් විශ්වාස කරන්නට යෙදුණු හේතු කවරේද යන්නත්, ඒ තුළින් ගැමියා නොදැනුවත්වම ගැමි සමාජයට ඉටු වූ කෘත්‍ය මොනවාද යන්නත් ඉහත නිමිති වර්ගීකරණය කිරීම තුළ පහසුවෙන්හඳුනා ගත හැකි වෙයි.

සිංහල ගැමියා සහ පරිසරය අතර අතීතයේ පැවතියේ අවියෝජනීය සබඳතාවයකි. සතා-සිව්පාවාට, ගහකොළ වලට මොවුන් දැක්වූයේ අසීමිත ආදරයකි. එම නිසා අනාගතයේ සිදු විය හැකි සිදුවීම් පරිසරය මඟින් දැනුම් දෙන බවට ඔවුන් විශ්වාස කළෝ ය. ප්‍රධාන වශයෙන් ගැමියන් තම ජීවිතයේ දී ලබා ගත් අත්දැකීම් ද ඒ සඳහා බලපාන ලදී. ගැමියෝ නිමිති යැයි එසේ හඳුනා ගත් දෑ දැඩි ලෙස විශ්වාස කිරීමට ද හේතුව පරිසරය සමඟ වූ දැඩි සබඳතාවයි. එසේම මෙම විශ්වාස එක්තරා අන්දමකට ගැමි සමාජයේ පාලනයට, ආරක්ෂාවට, වෘත්තියට උපකාරී වූවා යැයි හඳුනා ගත හැක.

"බිය හා බලාපොරොත්තුව පදනම් කර ගත් මෙම නිමිති හෝ සංඥා පිළිබඳ විශ්වාස, සිරිත්-විරිත් පද්ධතියක් වශයෙන් චිරාත්කාලීනව සම්භාවනයට පාත්‍ර වූවා පමණක් නොව මානව හා සාමජමය හැසිරීම් පාලනයට ඒවායෙන් ඉඩ ප්‍රස්ථාවක් ලැබිණි" (චන්දන, 1992). ඒ අනුව පහත සත්ත්වයින් සම්බන්ධ පෙරනිමිති විශ්වාස කිරීම තුළින් සමාජයට යම් ආකාරයක කෘත්‍යයන් ඉටු වූ බැව් හඳුනා ගත හැකි වෙයි.

"බළල් සංවාසය හා බළල් පොර දැකීම අසුභ නිමිති ලෙස පිළිගැණින. බළලාගේ ලිංගේන්ද්‍රිය කටු සහිත වීම නිසා බැළලියට සංසර්ග කාර්යයේ දී එයින් දරා ගත නොහැකි වේදනාවක් හට ගනී. බැළලිය වියරුවෙන් මෙන් කෑ ගසන්නේ එබැවිනි. එවැනි වේදනාබර වියරු කෑ ගැසීමක් සහිත සිද්ධියක් අප්‍රියජනක දසුනක් විය. එවන් අවස්ථාවක කුඩා දරුවෙකු එතැනට ගියහොත් බැළලියගේ පහුරු ගෑම් වලට හා සපා කෑම් වලට ලක් විය හැකි විය. බළලාගේ දත් හා නිය විෂ සහිත වීම නිසා එවැනි අනතුරකින් වළක්වාලීම අරමුණු කර ගෙන එම අවස්ථාව අසුබ නිමිතිකාරක දසුනක් ලෙස සලකා ඇති බව ද සිතිය හැකි ය" (ආනන්ද, 2000). කුඩා දරුවන් සුරතල් සතුන්ට ආශා කරති. එබැවින් ඔවුන්ගේ ආරක්ෂාව පමණක් නොව වැඩිහිටියන්ගේ ආරක්ෂාව ද මෙයින් බලාපොරොත්තු වූ බැව් හඳුනා ගත හැකි ය. නිමිත්තක් වුව ද එහි දී ආරක්ෂාව උදෙසා ක්‍රියා කර ඇත.

බෝදිලිමාගේ හඬ අසුබ නිමිත්තක් යැයි ගැමියෝ විශ්වාස කරති. ඒ වෙනුවෙන් ගොඩනැගුනු ජනප්‍රවාද වන අතර මෙම විලාපය නැවැත්වීමට රෑ පැල් රකින ගොවියෝ සිදු කරන කෙම් ක්‍රමය මගින් තම වෘත්තිය කර ගෙන යාමට ශක්තියක් වෙයි. "මෙයින් වැළකීමට රෑ පැල් වල දී පමණක් එක්තරා රහස්‍ය කෙමක් කරනු ලැබේ. එනම් බෝදිලිමා කෑගසන මෙහොතේ ස්වයංමෝචනය කොට ශුක්‍ර ගොටුවකට ගෙන පසෙකින් තැබීමයි. විළිරුජාවට බෙහෙත් ලෙස සලකන බෝදිලිමා එය රැගෙන යන්නේ ය. එයින් පසුව උගේ විලාපය නවතින බවත් ගැමියා විශ්වාස කරයි.

සියුම් ලෙස කල්පනා කර බලන විට ගැමියාගේ මේ කෙම් ක්‍රමයේ මනෝ විද්‍යාත්මක පදනමක් ඇති බව පෙනේ. ඕනෑම පුද්ගලයෙකුට ස්වයංමෝචනය කළ හැක්කේ සිත ඒකාග්‍ර වූ විට පමණි. මෙම කෙමේ දී සිදුවන්නේ බෝදිලිමාගේ හඬ අමතක කරවීම සඳහා සිත වෙනත් අරමුණකට යොමු කර වීමයි. එයින් රැය පහන් කර වීමටත් මනා පිටිවහලක් ලැබෙන්නේය" (වනසිංහ, 1999). මෙහි දී බිය උපදවන නිමිත්තක් ලෙස ගැමියා බෝදිලිමාගේ හඬට අකමැත්තක් දැක්වීම සහ එම බිය දුරු කර ගෙන රෑ පැල් රැකීමට ගොවියාට මෙම කෙම ශක්තියක් වෙයි. එපමණක් නොව රැය පහන් වන තුරුම වන සතුන්ගෙන් හේනට සිදු වන හානි පිළිබඳව ද අවදියෙන්, අවබෝධයෙන් සිටීමට හැකියාව ලැබෙයි.

මේ අයුරින් ආකස්මිකව පහළ වූ මෙම නිමිති පුරාණ ශ්‍රී ලාංකේය ගැමියාගේ දෛනික කටයුතු වලට ප්‍රබල ලෙසම බලපෑමක් එල්ල කළ බැව් හඳුනා ගත හැකි ය. විශේෂයෙන්ම මෙම නිමිති පහළ වීමත් එහි ඵලවිපාක ලැබීමට ගත වන කාලය අනුව නිමිති වල කාර්මය නැතිනම් කෘත්‍යමය වැදගත්කම කොටස් දෙකකට බෙදිය හැකිය.

1. දිගු කාලීන ස්වභාවය
2. කෙටි කාලීන ස්වභාවය (චන්දන, 1992)

මෙසේ වර්ග කිරීම නිමිති වල ක්‍රියාකාරීත්වයේ ස්වභාවය අනුව කාර්යමය වැදගත්කම ඉහත බෙදා දැක්වීම තුළ මනාව හඳුනා ගත හැකි ය.

1. දිගු කාලීන ස්වභාවය

ආකස්මික නිමිති පහල වූ පසු එහි සුබ-අසුබ, ඵල-විපාක ලැබීමට ගත වන කාලය එක් දිනකට වඩා වැඩි වීම නිමිති වල කාර්යමය වැදගත්කමෙහි දිගුකාලීන ස්වභාවය ලෙස හැඳින්වේ. එනම් පුරාණ ගැමියා මෙම පෙර නිමිත්තක් සිදු වීම සහ ඉන් ප්‍රතිඵල ලැබෙන කාල වකවානුව පිළිබඳව දින ගණන් බැලූහ. ප්‍රතිඵල ලැබීමට ගත වන කාල සීමාව එක් දින ඉක්මවන සෑම පෙරනිමිත්තක්ම මෙම ගණයට අයත් වේ.

පැරැන්නන් නාගයින්ගේ සංසර්ගය දැකීම අසුබ පෙර නිමිත්තක් ලෙස හඳුනා ගත්හ. එයට හේතුව නිමිති වල කාර්යමය වැදගත්කමයි. එනම් "නාගයා සංසර්ගයේ යෙදෙන අවස්ථාවේ නාගයාගේ දෙදළෙහි විෂ උග්‍රව පවතින බව කියැවේ. ඒ මෙහොතේ එතැනට කිසිවෙකු පැමිණියහොත් එය උගේ සැපයට බාධාවක් වන බැවින් ඔහු වෙත හඹා විත් දෂ්ට කරයි. එම අර්ථය පදනම් කර ගෙන නාගයාගෙන් විය හැකි අනතුරක් වළකවනු පිණිස ගොඩ නැගුණු විශ්වාසයක් ලෙස ද සැලකිය හැකි ය" (ආනන්ද, 2000). මෙවන් අවස්ථාවක නයෙකු දෂ්ට කළහොත් දින තුනකින් මරණයට පත් වන බව ගැමි විශ්වාසයයි. එසේ වුවහොත් කුමන හෝ පුද්ගලයෙකු මරණයට පත් වීම ගමට, පවුලට දුක්ඛදායක ආලාභයක් වනු ඇත්තේ ය. එම නිසා මෙම දිගු කාලීන ගණයට අයත් වේ.

කෘෂිකාර්මික ජීවන රටාව උදෙසා ද මෙම නිමිති බොහෝ සෙයින් උපකාරී බැව් පැහැදිලි වෙයි. "එකල ගමක ජීවත් වූ සියලුම මිනිසුන් කෘෂිකර්මය උදෙසා ජලය ලබා ගත්තේ වැවෙනි" (රත්නපාල, 2000). විශේෂයෙන්ම කිරලා වැව් ඉවුරු වල, කුඹුරු වල නියරෙහි බිත්තර දමන පක්ෂියෙකි. එම බිත්තර දමන වැව් ඉවුරේ සීමාව අනුව ද ගැමියා වැස්සේ ප්‍රමාණය දැන ගත්හ. එනම් "වැව් ඉවුර ආසන්නයේම බිත්තර දැම්මේ නම් නියගයක් එන බවත්, වැව් ඉවුරෙන් ඈතට වන්නට බිත්තර දැම්මේ නම් වැව පිටාර ගලන්න වහින බවත් ගැමියෝ අත්දැකීමෙන් දැනගත්තා සේම අනාවැකියක් ලෙස භාවිතා කළේ ය" (මලවිගේ, හිරු අභිවන්දනා පෝදා වැඩසටහන, 2014/09/08). ඒ අනුව කෘෂිකාර්මික කටයුතු කෙරෙහි ඔවුන් අවධානය යොමු කළේ ය.

කැරල් හඬ පෙරනිමිති සහ පෙරමග නිමිති සලකුණු කරන්නකි. පැරැණ්නෝ විශ්වාස කළ අන්දමට කැරලා අහසේ පියාසර කරමින් කෑ ගැසීම වර්ෂාරම්භය සලකුණු කිරීමකි. ඒ අනුව "දින හතක් ඇතුළත හෝ ඊට ආසන්න කාල සීමාව දී වැසි ලැබෙතැයි පුරුද්දෙන් දන්නා ගොවියෝ අක් වැස්ස බලාපොරොත්තුවෙන් නවදැලි වැපිරීම ආරම්භ කරති" (චන්දන, 1990). තම වෘත්තිමය කාර්යයන්ට නිමිති පිටුබලයක් කරගත් අයුරු එයින් පැහැදිලි වෙයි.

සාමාන්‍යයෙන් නිවෙසක් තුළ දෙබරයක් හෝ බඹරයක් බැඳීම අසුබ නිමිත්තක් ලෙස සැලකුව ද විහාරස්ථානයක, දේවාලයක ආදී පොදු ස්ථාන වල බඹර සැදීම සුබ ලකුණක් සේ සැලකේ. එයට හේතුව නිවසක කුඩා දරුවන්ගේ දඟකාරකම් සමඟ එවන් සතුන් ඇවිස්සුනහොත් ඉතාම හානිදායක වන නිසාය. ඒ නිසා අන්තරාදායක බව කරණ කොට ගෙන එසේ විශ්වාසය ගොඩ නැගන්නට ඇත. එහෙත් "විහාරස්ථාන වල බඹර බැඳීම සුබ ලකුණක් වන්නේ එම ස්ථාන වල ආරක්ෂාව පිළිබඳව සැලකීම විය හැකි ය. බඹරුන් මිනිසුන්ගේ හඬට වුවද කලබල වෙයි. සහේතුකව විහාරස්ථාන වලදී සංවරව හැසිරීමට අනුබලයක් වූ බව පෙනේ. ඇතැම් විහාරස්ථාන වල බඹරුන් සිටින නිසා වැඩිපුර ඝෝෂා කිරීමෙන් වළකින ලෙස අවවාද කිරීමට සිදු වෙයි. තවත් ලක්ෂණයක් නම් 'කිලි' සහිතව පැමිණියහොත් බඹරු ඇවිස්සෙන බව විශ්වාස කිරීම ය. මෙයින් 'කිලි' යනුවෙන් අයහපත් අදහසින් යුතුව පැමිණීම සංකේත වෙයි. නිධාන ගැනීමට ආදී සොර කටයුතු වලට පැමිණි පුද්ගලයින්ට බඹරු ඇණ තිබෙන බවට කතා නොයෙක් විට හමු වෙයි" (ආනන්ද, 2000). පොදු ස්ථාන තුළ මිනිසුන්ගේ සංවර බව විනීත බව ඇති කිරීමට ද නිමිති ඉවහල් වූ බව මෙම කරුණු වලින් පෙනේ. මිනිසාගේ අභිවෘද්ධිය යනු ඉහත නිමිත්තේ සුබ බවේ සංකේතය ලෙස දැක්විය හැකිය.

බල්ලන්ගේ උඩුබිරලීම, නරි හූව මෙන්ම උලමාගේ විලාපය නරක විපත්තියක පෙරනිමිත්තක් වේ. එනම් ගමට නැති නම් යම් ආතුරයන්ට වඩාත් හානිදායක බැව් පැරණි ගැමියා විශ්වාස කිරීම පදනම් කර ගෙන විවිධ කෙම් ක්‍රම, අභිචාර ක්‍රම, ක්‍රියාත්මක කරති. දෙවියන් උදෙසා පුද පඬුරු තැබීම හා වෙදදුරන් වෙතින් කර ගනු ලබන ප්‍රතිකාර වැඩිකොට ගැනීම ද විපත් වලින් වැළකීමට ගම්බද ජනයා ගනු ලබන උත්සහයන්ය. මේ තුළින් ගැමියන්ගේ සාමූහිකත්වය සහ සහජීවනය වර්ධනය වෙයි. එනම් අභිචාරාත්මක අවස්ථාවල දී මුඛ්‍ය අරමුණ රෝගීන් සුව කර ගැනීම, ගම විපත් වලින් මුදවා ගැනීම වුව ද නිලීනව ගම්වැසියන්ගේ සාමූහිකත්වයෙන් මෙම අභිචාරාත්මක වැඩසටහන් ක්‍රියාත්මක වීම සහ ඒ තුළින් ග්‍රාමීය සමඟිය ද වර්ධනයට වේ.

කබරගොයෙකු නිවසට පැමිණීම අසුබ බැව් ගැමියන්ගේ විශ්වාසයයි. එයට විද්‍යාත්මක පදනමක් ඇති බව ද හෙළි වෙයි. "උගු විෂකුරු සර්පයන් අනුභව කිරීම සහ වසුරු පිඩක ස්පර්ශයෙන් පවා මිනිස් සිරුරට පීඩා ඇති වීම විය හැකි ය. කබරයාගෙන් උග්‍ර විෂක් සාදා ගෙන තරහකරුවන් මරණයට පත් කළ අවස්ථා ද වූ බව කියැවෙයි. අනෙක් අතට උගු ඕනෑම කසල ගොඩක ලගින පෙනුමෙන් පවා අප්‍රිය සතෙකි. නිවසකට පැමිණීම ලෙඩ රෝග ඇති කරන විෂබීජ රැගෙන පැමිණියාක් බඳු වෙයි" (ආනන්ද, 2000). මේ නිසා ගැමියෝ කබරගොයා එළවා දැමීමට රිකිලි සහිත දෙහි අත්තකින් ගොම මිශ්‍ර කහ දියර ඉසිනු ලබන්නේ විසබීජ නාශක ද්‍රව්‍යයක් වශයෙනි. විද්‍යාත්මක සත්‍යයන් ද මේ තුළ ගැබ් වෙයි.

මේ ආදී වූ හේතු නිසා දාගුකාලීන කාර්යමය වැදගත්කමක් නිමිති වල ඇතැයි පැවසීම නිවැරදි වේ.

2. කෙටි කාලීන ස්වභාවය

කෘත්‍යාත්මක වැදගත්කම අනුව නිමිති පිළිබඳව විමසා බැලීමේ දී බොහෝමයක් නිමිති මෙම කෙටි කාලීන ස්වභාවයට අයත් යැයි හඳුනා ගත හැකි ය. නිදසුන් ලෙස බල්ලා කම්පට ගැසීම, හූනෙකුගේ හැඬීම යනාදී නිමිති ගමනකට, සුබ කටයුත්තකට බාධක සලකුණු වෙයි. එනම් බාධක නිමිතිය. මෙම "බාධක නිමිති වලින් වැළකී සිටීම සඳහා පිළිපදින ක්‍රමවේදයක් තිබේ. එය නුවර කලාවියේ ගැමියා හඳුන්වන ආකාරයට 'බාධක ප්‍රමාදය' නම් වේ" (චන්දන හිමි, 1992). මෙම බාධක ප්‍රමාදයේ කාල සීමාව ඇතැම්හු වයෝවෘද්ධ හරකෙකුට වතුර බීමට ගත වන කාලය යැයි විවිධ ප්‍රදේශ වල ව්‍යවහාර වෙයි. එය සාමාන්‍ය වේලාවෙන් පැය කාලක පමණ ප්‍රමාදයකි.

- සිදු වීමට යන අනතුරකින් වැළකී සිටීමට;
- සුබ කටයුත්තකට;
- අසුබ කටයුත්තකට; යනාදී සියලු දෙයට බාධක ප්‍රමාදය බලපානු ලබයි.

ගොවියෝ පැල් රැකීමට රාත්‍රියෙහි පිටත් වන විට මෙවැනි බාධක නිමිත්තක් හේතුවෙන් ගමන ප්‍රමාද කිරීම තුළ ඇතැම් විට සතුන්, සර්පයින්ගෙන් වන අනතුරු වලින් වැළකීමට ප්‍රමාදය වැදගත් වෙයි. "තමා කසියම් පුද්ගලයෙකුට යම්කිසි සතුරුකමක් කිරීම සඳහා පිටත් වන අවස්ථාවේ දී ද බාධක නිමිති හේතුවෙන් පිළිපදිනු ලබන බාධක ප්‍රමාදය වැදගත් වේ. එනම් ඔහුගේ කෝපය සංසිඳීම සඳහා ප්‍රමාද වන කාලය ඉවහල් විය හැකි නිසා ය. සමහර අවස්ථා වල දී බාධක නිමිති කරණකොට ගෙන සතුරාගේ ජීවිතය බේරීමට ද පුළුවන. එබඳු පුවතක් අප චිරන්තන සාහිත්‍යයේ ද වෙයි. මස් වැද්දාගෙන් මුව නාම්බෙකුගේ ජීවිතය ගලවා ගැනීමට බාධක නිමිත්ත වූ කැරල් ශබ්දය හේතු වූ බව 'කුරුංග මිග ජාතකයේ' එයි" (චන්දන, 1992).මේ අනුව සුබ දෙයකතටත් අසුබ දෙයකටත් බාධක ප්‍රමාදය බලපානු ලබයි.

"බාධක නිමිති විමසීමේ දී නිවසින් පිට වන විට කිසිවක් ගෙන යන්නට අමතක වීම අසුබ බාධාවකි එහෙත් සුදුවට යාමේදී එය සුබ බාධාවකි" (විජේසේකර, 1986). කෙසේ වෙතත් නිමිති නිර්මාණය වීම තුළ පුරාණ ලාංකේය ගැමියාගේ සිරිත්-විරිත් වල පැවැත්ම කෙරෙහි ද බලපාන්නට ඇත. දිගු කාලීන හා කෙටි කාලීන වශයෙන් නිමිති වල කාර්යමය වැදගත්කම වර්ග වුවද ප්‍රධාන වශයෙන්ම නිමිතිවිශ්වාස පද්ධතියක් ලෙස ශ්‍රී ලාංකේය සංස්කෘතිය සඳහා බලපෑ බැව් ද පැහැදිලි වේ.

**නිගමනය**

ගැමි සමාජයන්හි පවත්නා සුවිශේෂී සංස්කෘතිකාංගයන් අතරින් නිමිති ගැමි ජනයාගේ දෛනික ජීවිතයේ ප්‍රධාන අංගයක් බවට පත් වීම හේතු කරගෙන ඔවුන්ගේ ජීවිතවලට කෘත්‍යාත්මක බලපෑමක් එල්ල වී ඇති බැව් ඉහත විමසුමෙන් හඳුනා ගත හැකි වෙයි. එනම් මෙම නිමිති ගැමි සමාජය තුළ සමාජ පාලන කාරකයක් ලෙස, සමාජයේ අභිවෘද්ධිය උදෙසා සහ සමාජ ආරක්ෂාවට ද ක්‍රියාත්මක වී තිබේ.

**ආශ්‍රිත මූලාශ්‍රය**

ගමගේ, නිමල් ජේ. (1998), *සත්ත්ව සන්නිවේදනය*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

චන්දන හිමි, ඔරුක්මාන්කුලමේ (1990) *නුවර කලාවියේ ජනකවි*, පෙතිකඩ ප්‍රකාශකයෝ, රත්මලාන.

චන්දන හිමි, ඔරුක්මාන්කුලමේ (1992), *නුවර කලාවියේ නිමිති*, පෙතිකඩ ප්‍රකාශකයෝ, රත්මලාන.

දිසානායක, මුදියන්සේ (1997), *වන්නියේ සමාජ සංවිධානය හා නවීකරණය*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

මාදුවගේ, සිරිපාල (2001), "සුබ-අසුබ නිමිති ජීවන ගමනේ සැලකිය යුත්තක්ද?", *නවයුගය,* සීමාසහිත ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම, කොළඹ.

ආනන්ද මෛත්‍රී ස්ථවිර, බලංගොඩ (1952), *කාශ්‍යප සිහාවදානය හෙවත් බුද්ධ චරිතය*, තරුණ බෞද්ධ සංගමය, කොළඹ.

පිරිස්, ඥානසිරි (2007), *ශ්‍රී ලාංකික ජන සමාජයේ ඇදහිලි සහ විශ්වාස*, වාසනා ප්‍රකාශකයෝ, දංකොටුව.

රත්නපාල, නන්දසේන (2010), *ජනශ්‍රැති විද්‍යාව*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

ලියනගේ, සිරි (2000), *ජනශ්‍රැති ශබ්දකෝෂය*, සිරිලිය ප්‍රකාශකයෝ, පොල්ගස්ඕවිට.

වනසිංහ, ජයමැණිකේ (1999), *ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය හා සම්බන්ධ කෙම් ක්‍රම*, කතෘ ප්‍රකාශනය, ගලේවෙල.

විජේසූරිය, එස්. (1997), *සාම්ප්‍රදායික ජීවන රටා සහ කෙම්*, සහභාගීත්ව සංවර්ධන පර්ෂදය, කෝට්ටේ.

විජේසේකර, නන්දදේව (1969), *ලංකා ජනතාව*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

හිරු අභිවන්දනා පෝදා රූපවාහිනී වැඩසටහන-2014/09/08

Bertrand, Alvin. L. (1958), *Rural Sociology*, Mcg Raw-Hill Book Company Inc, London.

Coon, Carleton. S (1954*) The Story of Man*, Alfred AKnoff. Inc, New York.

Firth, R. (1951), Elements of Social Organization, Ec4, London.

Frazer, J.G. (1954), *The Golden Bough: A Study In Magic And Religion*, Macmillan & Co.Ltd, London.